සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

# නර්තනය

9 ශ්‍රේණිය | කාලය පැය 02 යි.

නම/ විභාග අංකය:

## I - කොටස

- සියළුම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 - 15 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 එකොළොස්වන පා සරඹයේ සරඹ නාමය වනුයේ,

(i) දෙපැති අඩිය (ii) සුරල් අඩිය (iii) චක්‍ර අඩිය (iv) කරණම් අඩිය

02 දෑත පෑගීමේ සරඹය යනු

(i) අටවැනි ගොඩ සරඹයයි. (ii) නවවැනි ගොඩ සරඹයයි.

(iii) හත්වෙනි ගොඩ සරඹයයි. (iv) හයවැනි ගොඩ සරඹයයි.

03 උඩරට බෙර සරඹ වාදනයේ දී දෙවෙනියට වාදනය කරනු ලබන බෙර සරඹය වනුයේ,

(i) තකට තකට කුද තකට කුජං ජිං (ii) තකට

(iii) තකට කුජික්කඩ (iv) තකට කුදට

04 පංචතූර්ය වාද්‍ය භාණ්ඩ වර්ගීකරණයේ දි ඝණ වාද්‍ය භාණ්ඩ ඝනයට අයත් වේ.

(i) පන්තේරුව (ii) හක්ගෙඩිය (iii) රබාන (iv) තම්මැට්ටම

05 තකුං ජිං ජිං තකට දොමි තක" මෙම බෙර පදය ප්‍රස්තාර කිරීමේ දී යොදාගනු ලබන තිත වනුයේ,

(i) 2 + 3 (ii) 2 + 4 (iii) 3 + 4 (iv) 4 + 4

06 "සිද්ධ මුනිඳු වැඩ හිඳ බෝ මුල විදුරාසන....." මෙම කවිය

(i) පන්නෙලීමේ කවියකි. (ii) කඩතුරා කවියකි.

(iii) ගොයම් කවියකි. (iv) සොකරි කවියකි.

07 සබරගමු සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්තිකර්මය වනුයේ,

(i) කොහොඹා කංකාරි ශාන්තිකර්මය (ii) සුනියම් ශාන්තිකර්මය

(iii) දෙවොල්මඩු ශාන්තිකර්මය (iv) පහන්මඩු ශාන්තිකර්මය

08 කථක් නර්තන අධ්‍යාපන ආයතනයකි

(i) භාත්ඛණ්ඩේ විශ්ව විද්‍යාලය (ii) කොළඹ විශ්ව විද්‍යාලය

(iii) රුහුණු විශ්ව විද්‍යාලය (iv) රජරට විශ්ව විද්‍යාලය

09 ''අක්කේ අක්කේ අර බලන්නකෝ....'' ගිතය පද රචනය කළේ,

(i) දයානන්ද ගුණවර්ධන මහතා (ii) ආනන්ද සමරකෝන් මහතා

(iii) බෙනඩික් ප්‍රනාන්දු මහතා (iv) සුනිල් ආරියරත්න මහතා

10 කථක් නර්තනය සඳහා වාදනය කරනු ලබන වාද්‍ය භාණ්ඩයකි

(i) මෘදංගය (ii) වයලිනය (iii) පක්වාජ් (iv) වෙන්ඩාව

11 රංගනයේ යෙදෙන නළු නිළියන් විසින්ම දෙබස් ගායනා ඉදිරිපත් කෙරෙන නාට්‍ය

(i) මුද්‍රා නාට්‍ය (ii) ශෛලිගත නාට්‍ය

(iii) අර්ධ ශෛලිගත නාට්‍ය (iv) ගීත නාට්‍ය

12 ''වෙද නටන්නේ පළමුව සබයට එන්නේ.....'' මෙම කවිය

(i) කෝළම් ගැමි නාටකයට අයත් වේ. (ii) සොකරි ගැමි නාටකයට අයත් වේ.

(iii) නාඩගම් ගැමි නාටකයට අයත් වේ. (iv) රූකඩ ගැමි නාටකයට අයත් වේ.

13 ''ගත්ත තෙහිඟු තකට කකුද...'' මෙය

(i) කස්තිරමකි. (ii) සීරුමාරුවකි. (iii) කලාසමකි. (iv) අඩව්වකි.

14 පෙරත් කලෙක සිහ රජෙක් වැටුනි මහ... මෙම කවි පදය අයත් වන්නම වනුයේ,

(i) නෛයඩි වන්නම (ii) වෛරොඩි වන්නම

(iii) සිංහරාජ වන්නම (iv) තුරගා වන්නම

15 ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ඓතිහාසික පසුබිම පිළිබඳ තොරතුරු ගවේෂණයේදී උපයෝගී කරගත හැකි මූලාශ්‍රයක් නොවන්නේ,

(i) චරිත කතා (ii) සාහිත්‍ය කෘති (iii) වංශකතා (iv) සෙල්ලිපි

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට වරහන් තුළ දි ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

(තාත්වික නාට්‍ය / නවාබ් වලීජ් අලීෂා / විතත / අච්චන් මහාරාජ් / ශෛලිගත / පහතරට / විතතාතත / දයානන්ද ගුණවර්ධන / බෙනඩික් ප්‍රනාන්දු / උඩරට)

16 ''රන් වන් දූල් කරලින් පැසිලා''යන ගීතය ........................................ මහතා විසින් පද රචනය කළේය.

17 දයානන්ද ගුණවර්ධනයන්ගේ ''නරිබෑණා'' නාට්‍ය ........................................ නාට්‍ය සණයට අයත් වේ.

18 ........................................................................ රජු කථක් නර්තනය පිළිබඳ ග්‍රන්ථ රචනා කළේය.

19 කඩිප්පුව ආධාරයෙන් පමණක් වාදනය කරනු ලබන වාද්‍ය භාණ්ඩ ........................................ සණයට අයත් වේ.

20 අර්නොලිස් ඉඹුල්ගොඩ මහතා ........................................................................ නර්තන ශිල්පියෙකි.

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර, පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 02 කට පමණක් පිළිතුරු සපයන්න.

01 (i) පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රවීන නර්තන ශිල්පියෙකු නම් කරන්න.

(ii) කථක් නර්තන සම්ප්‍රදායේ සංගීත සම්ප්‍රධාය කුමක් ද?

(iii) ශෛලිගත නාට්‍යයක් නම් කරන්න.

(iv) පංචතූර්ය වාදනයේදී අතින් සහ උපකරණයකින් (කඩිප්පුවෙන්) වාදනය කරනු ලබන භාණ්ඩ හඳුන්වන නම කුමක් ද?

(v) ප්‍රස්තාරකරණයේදී භාවිතා කරනු ලබන සංකේත දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2 x 5 = 10)

02 (i) නාට්‍යයක් ඉදිරිපත් කරනු ලබන ආකාරය අනුව නාට්‍ය ශෛලීන් නම් කරන්න. (ලකුණු 02)

(ii) නාට්‍ය වර්ග හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ඉන් ඔබ කැමති නාට්‍ය වර්ගයක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

03 (i) "තකුං ජිං ජිං තකට දොංතක" මෙම බෙර පදය 3 + 4 දෙතිතට ප්‍රස්තාර කරන්න. (ලකුණු 05)

(ii) කඩතුරා, පන් නෙළීම, ගොයම්, සොකරි මින් ඔබ කැමති කවියක් මැදුම් තනි තිතට ප්‍රස්තාර කරන්න. (ලකුණු 05)

04 (i) ගැටබෙරය, තාලම්පට, දවුල, පහතරට බෙරය, උඩැක්කිය, බුම්මැඩිය, තම්මැට්ටම, හොරණෑව, හක්ගෙඩිය, පන්තේරුව, තලිය, බටනලාව

ඉහත සඳහන් භාණ්ඩ පංචතූර්ය වර්ගීකරණය අනුව වගුගත කරන්න. (ලකුණු 05)

(ii) පංචතූර්ය වාද්‍ය භාණ්ඩ වාදනය කරන අවස්ථා පහක් සඳහන් කරන්න. (ලකුණු 05)

05 (i) කථක් නර්තනය ප්‍රචලිත ප්‍රදේශ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) කථක් නර්තන ශෛලීන් හතර (ඝරානා) නම් කරන්න. (ලකුණු 04)

(iii) කථක් නර්තන අංග හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

06 (i) ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ප්‍රවර්ධනයට දායක වූ පහතරට සහ උඩරට නර්තන ශිල්පීන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 05)

(ii) ඔබ නම් කළ නර්තන ශිල්පියෙකු පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

07 (i) කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ පුරාවෘත්ත කතාව කෙටියෙන් ලියන්න. (ලකුණු 03)

(ii) දෙවොල්මඩු ශාන්තිකර්මය අතීතයේ සහ වර්තමානයේ පැවැත්වීමට හේතු සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) පහන්මඩු ශාන්තිකර්මයේ පුද ලබන දෙවිවරු හතරදෙනෙක් නම් කරන්න. (ලකුණු 04)